०३ तृतीयः पाठः।	ऋते ज्ञानात् न मुक्तिः। कारकपरिचयः। ०२

05. පඤ්චමී විභක්තිය (අපාදාන කාරකය)

යමකින්/යමකු කෙරෙන් යම් දෙයක් හෝ යමෙක් ඉවත් වනු ලැබේ ද එම ඉවත්වීමේ සීමාව අපාදාන නම් වේ. එය යෙදෙන්නේ පඤ්චමී විභක්තියෙනි.

ක්‍රියාකාරකම 3.1

०१. कृषिकः क्षेत्रात् आगच्छति।
०२. पर्वतात् सञ्चारकः पतति।
०३. अर्चकः मन्दिरात् निर्गच्छति।
०४. शरीरात् स्वेदं पतति।
०५. मुखात् दन्तं पतति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත සඳහන් වාක්‍යවල ඇති පඤ්චමී විභක්ති පද ලියන්න.
03. පහත දැක්වෙන ප්‍රථමා විභක්ති පදවලට අදාළ පඤ්චමී විභක්ති වචන තෝරා ලියන්න.

ප්‍රථමා	පඤ්චමී
नरः	
शिष्यौ	
वृक्षः	
हस्ताः	
धेनुः	

(शिष्याभ्याम् / नरात् / वृक्षात् / धेनोः / हस्तेभ्यः)

पर , इतर , आरात् , विना , ऋते , प्रत्यक् , प्राग्

ආදී කාල වාචී හා දිශා වාචී ශබ්ද යෝගයෙහි පඤ්චමී විභක්තිය යෙදේ.

तृष्णात् अन्यः। आरात् वनात्।
ऋते ज्ञानात् न मुक्तिः। नगरात् पूर्वः

ක්‍රියාකාරකම 3.2

०१. आरात् वनात् विहारं अस्ति ।

०२. अन्यो प्रासादात् चैत्यम् ।

०३. इतरो ग्रमात् नगरं ।

०४. पूर्वो नगरात् आरोग्यशाला ।

०५. प्राक् त्वत् अहम् तिष्ठामि ।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. මෙම වාක්‍යවල ඇති පඤ්චමී විභක්ති පද ලියා දක්වන්න.
03. ආරාත්, අන්‍යො, ඉතරො, පූර්වො, ප්‍රාක් යන අව්‍ය හා දිශා වාචී ශබ්දවලින් ලබාදෙන අර්ථ මොනවාදැයි ලියන්න.

- ප්‍රභවාර්ථයෙහි පඤ්චමී විභක්තිය ගනී.

प्रभवति नदी जलमूलात् ।
बीजात् अङ्कुरः जायते ।

ක්‍රියාකාරකම 3.3

०१. लोभात् क्रोधः प्रभवति ।

०२. मोहात् पापं जनयति । ।

०३. उद्योगात् जयं लभते ।

०४. विनयात् पात्रतां याति ।

०५. धनात् धर्मं च सुखं च लभते ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. මෙහි සඳහන් පඤ්චමී විභක්ති පද ලියන්න.
03. පහත සඳහන් වචන යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

०१. पापात् ....

०२. पुण्यात् ....

०३. ज्ञानात् ....

०४. कृपणात् ....

०५. स्नेहात् ....

- මර්‍යාදා (සීමා), අභිවිධි (ව්‍යාප්ති) අර්ථයන්හි යෙදෙන ආ ශබ්දය සමග පඤ්චමී විභක්තිය භාවිත වේ.

आ निर्वाणात् बुद्धं भज ।

आ वनात् सा रुरोद ।

ක්‍රියාකාරකම 3.4

०१. आजन्मनः कुतः सुखम् ।

०२. आसमुद्रात् उर्वी भवति ।

०३. आमरणात् दुःखमेव विन्दति ।

०४. आवनात् देवः अवर्षत् ।

०५. आवृद्धत्वात् यौवनत्वं भजति ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙහි ඇති පඤ්චමී විභක්ති පද ලියා දක්වන්න.

03. පහත වාක්‍යවලට සුදුසු පඤ්චමී විභක්ති පද තෝරා ලියන්න.

०१. ....वनं वर्तते ।

०२. .... बालकालः भवति ।

०३. .... पूर्वाह्णम् भवति ।

०४. .... प्राकारः अस्ति ।

०५. ....पथं वर्तते ।

(आसमुद्रात् / आपथः / आसायाह्नात् / आयौवनात् / आग्रमात्)

• යමකින්, යමකුගෙන් බියක්, තැතිගැනීමක් ඇති වේ නම් එසේ බියට හේතුවන්නා පඤ්චමී විභක්තියෙන් තැබේ.

चोराद् बिभेति बालकः।

ක්‍රියාකාරකම 3.5

०१. मार्जारात् मूषिकः त्रस्यति।

०२. कालात् जन्तवः बिभेति।

०३. सर्पात् भेकः भायति।

०४. दारकः गजात् अभायत्।

०५. पिङ्गलकः संजीवकस्य शब्दात् अत्रस्यत्।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. එම වාක්‍යවල ඇති පඤ්චමී විභක්ති වචන ලියන්න.

03. පහත වාක්‍යවල ඇති හිස්තැනට සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....सज्जनाः भायन्ति।

०२. .... धनिकः भायिष्यति।

०३. .... चोरः त्रस्यति।

०४. .... शिष्यः अभायत्।

०५ .... गोमायु श्रुगालः अभायत्।

(आरक्षकात् / असज्जनेभ्यः/ चोरात् / आचार्यात् / दुन्दुभेः)

• හේත්වර්ථයෙහි පඤ්චමී විභක්තිය වේ.

कस्मात् कारणात् कुपितः।

पुण्यात् दृष्टः माता।

පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

01. යමකින් යමක් ඉවත්වේ ද එහි පූර්ව සම්බන්ධය පැවති පුද්ගලයා හෝ වස්තුව අදාළ වන වචනය .... විභක්තිය ගනී.
02. ඇතැම් අව්‍යපද සමගත් දිශාවාචී ශබ්ද සමගත් යෙදෙන පද .... විභක්තිය ගනී.
03. යමකින් යමක් උපදී නම් පෙර සම්බන්ධ පැවති පදය .... විභක්තිය ගනී.
04. සීමාර්ථය ප්‍රකාශ කරන ආ ප්‍රත්‍යය සහිත වචන ද .... විභක්තිය ගනී.
05. යමකින් බිය සන්ත්‍රාස ගෙන දේ නම් ඊට මූලික වන වචන .... විභක්තිය ගනී.

विद्या ददाति विनयं
विनयाद्याति पात्रताम्।
पात्रत्वाद्धन माप्णोति
धनाद्धर्मं ततः सुखम्॥

විද්‍යාව හික්මීම දෙයි. හික්මීමෙන් ගෞරවයට පාත්‍රවේ. ගෞරවයට පාත්‍රවීමෙන් ධනය ලබයි. ධනය ලැබීමෙන් ධර්මය ද සැපය ද ලබයි.

06. ෂෂ්ඨී විභක්තිය

විශේෂ්‍ය විශේෂණ වශයෙන් සිටි පද දෙකක සංයෝගයෙන් අයිතිය හෙවත් සම්බන්ධය (ස්වාම්‍යර්ථය) ප්‍රකට කෙරෙන්නේ ෂෂ්ඨී විභක්තියෙනි.

चन्द्रस्य किरणः रमणीयः।
रावणस्य पत्नी मन्दोदरी इति।

ක්‍රියාකාරකම 3.6

०१. राहुलस्य पुस्तकमिदम्।
०२. वीरस्य औदार्यम् उत्तमम्।
०३. सिरिपालस्य गृहं महन्तम्।
०४. भूपतेः सेना गच्छति।
०५. तस्य भार्या सुतं असूत।

01. ඉහත සදහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. එම වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. මෙහි ඇති ෂෂ්ඨී විභක්ති පදවල අර්ථයන්හි ඇති පොදු ලක්‍ෂණය කුමක්ද?

04. පහත දැක්වෙන ප්‍රථමා විභක්ති පදවලට අදාල ෂෂ්ඨී විභ්ක්ති පද තෝරා යා කරන්න.

०१. नरः	धेन्वोः
०२. गुरुः	गङ्गायाः
०३. नौः	कर्तुः
०४. धेनुः	हरेः
०५. वधुः	गुरोः
०६. गङ्गा	पत्युः
०७. कर्ता	नरस्य
०८. पिता	नावः
०९. पतिः	वध्वाः
१० हरिः	पितुः

- ජාති, ගුණ, ක්‍රියා, ද්‍රව්‍ය වාචක සමූහයකින් එකක් වෙන්කර ගැනීමක දී (නිර්ධාරණාර්ථයෙහි) සමූහය අදාළ වන වචනය ෂෂ්ඨී විභක්තිය වේ.

व्याकरग्रन्थानामष्टध्यायी श्रेष्ठा ।
श्रेष्ठः शक्रः देवानाम् ।

ක්‍රියාකාරකම 3.7

०१. तयोः एकस्य हस्तात् मूल्यं अपतत् ।

०२. तेषाम् एकः मूर्वः ।

०३. तेषाम् एकः अन्धः ।

०४. तेषां त्रयः शास्त्रपारंगताः ।

०५. कवीनां कालिदासः प्रमुखः ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පර්වර්තනය කරන්න.

02. මෙහි ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. මෙහි ෂෂ්ඨී විභක්ති වචනාර්ථවල දැකිය හැකි විශේෂ ලක්ෂණය කුමක්ද?

04. පහත වාක්‍යවලට සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....भिक्षूणां प्रमुखः शारिपुत्रस्थविरः।

०२. .... रम्यं नाटकं शाकुन्तला।

०३. .... प्रमुखः ज्योतिपालः।

०४. .... प्रधानः स्वर्णमाली चैत्यम्।

०५. .... कसीभारद्वाजः प्रधानः।

(कृषीवलानां / धर्मकथिकानां/ चैत्यानाम्/ नाटकानां/ गायकानां)

අකමැත්ත, අනාදරය ප්‍රකාශ කිරීමේදී ද ඊට බඳුන් වන්නා ෂෂ්ඨී විභක්තියෙන් වේ.

अगच्छत् स वनं रुदतोः मतापित्रोः।

ක්‍රියාකාරකම 3.8

०१. पृथग्जनानां भिक्षूनां रुदतां सम्यग्सम्बुद्धः परिनिर्वाणमगच्छत्।

०२. आचार्यस्य वारितस्य शिष्यः गृहं गतः।

०३. कुमारदासस्य अनिच्छन्तस्य कालिदासः दिवं गतः।

०४. दारकस्य दुःखितस्य माता पञ्चत्वं गतः।

०५. मातापित्रोः निवारितयोः पुत्रः विदेशं गतः।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. පහත වාක්‍යවලට සුදුසු ෂෂ්ඨී විභක්ති පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....अप्रसादस्य श्रामणेरः अधावत्।

०२. .... निवारितस्य दमनकः पिङ्गलक समीपं अगच्छत्।

०३. .... अप्रसन्नास्याः रावणः अपहरत्।

०४. .... अनिच्छन्तस्य अवीचिं गतः।

०५ .... रुदतः सिद्धार्थः अभिनिष्क्रमत्।

(करटकस्य / गुरोः/ देवदत्तस्य / सीतायाः/ यशोधरायाः)

दूर, अन्तिक, निकट, हेतु යන ශබ්ද සමග යෙදෙන නාමය ෂෂ්ඨී විභක්තිය ගනී.

ग्रामस्य दूरम्।

नगरस्य अन्तिकम्।

ක්‍රියාකාරකම 3.9

०१. नगरस्य दूरात् वनं अस्ति।

०२. ग्रामस्य अन्तिके वापिं अस्ति।

०३. विहारस्य निकटम् गृहं अस्ति।

०४. औषधस्य हेतोः जीवति।

०५. आहारस्य हेतोः भिक्षति।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යයන්හි ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. පහත වාක්‍යවලට සුදුසු වචනවල අංක නිවැරදි ව ගළපා වාක්‍ය සකසන්න.

१.	गृहस्य .... महावृक्षम् अस्ति।	१	समन्तकूटपर्वतस्य
२.	परिवेणस्य .... पाठालयमँ अस्ति।	२	गिलानस्य
३.	कोलम्बनगरस्य..................अनुराधमुरनगरम् अस्ति।	३	समीपे
४.	अविद्या .... संस्काराः भवन्ति।	४	निकटम्
५.	कूपस्य .... कृष्णसर्पः तिष्ठति।	५	दूरात्
६.	.... दूरात् कल्याणिपुरं भवति।	६	हेतोः
७.	.... निकटम् वैद्यः तिष्ठति।	७	अन्तिके
८	.... हेतोः नामरूपं भवति।	८	विज्ञानस्य

• තව්‍ය අනීය ප්‍රත්‍යාන්ත ශබ්දයන්ගේ යෝගයෙහි තෘතීයා හා ෂෂ්ඨී විභක්ති වේ.

धनं कस्य देयम्।
इदं मम करणीयम्।

ක්‍රියාකාරකම 3.10

०१. अस्माकं कर्तव्यं कार्यानि।

०२. शिष्यानां पठितव्यं पुस्तकम्।

०३. कृषीवलस्य कर्तव्यं क्षेत्रम्।

०४. सर्वस्य गमणीयं लोकम्।

०५. शिष्यानां वाचणीयं पाठानि।

01. ඉහත සදහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද ලියා දක්වන්න. එම වචන කවර අර්ථවල යෙදී ඇත් දැයි ලියා දක්වන්න.
03. පහත වාක්‍යවලට සුදුසු ෂෂ්ඨී විභක්ති පද යොදා හිස්තැන් පුරවන්න.

०१. ....जित इन्द्रियानि।

०२. .... कृत कृत्यानि।

०३. .... ऊढ भारं।

०४. .... म्लान माला।

०५. .... भग्न भारं।

(वृषभस्य/ वृक्षस्य / संजीवकस्य / बुद्धस्य / अरहन्तस्य)

• අධිපති, ඊශ්වර, ස්වාමී, යන ශබ්දයන් හා යෙදෙන නාම පදය ෂෂ්ඨී විභක්තිය ගනී.

शिष्यानां नायकः सिद्धार्थः।

ක්‍රියාකාරකම 3.11

०१. धर्मस्य स्वामी भगवान् बुद्धः।

०२. नरानां अधिपतिः नरेन्द्रः।

०३. कवीनां ईश्वरः कवीन्द्रः।

०४. गजानां स्वामी गजनायकः।

०५. व्यापारस्य अधिपतिः व्यापारिकः।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද ලියා දක්වන්න.
03. එම වචන ෂෂ්ඨී විභක්තියෙන් ලිවීමට විශේෂ හේතුව කුමක්ද?
04. පහත වාක්‍යවලට සුදුසු ෂෂ්ඨී විභක්ති පද තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....अधिपतिः जनाधिपः।

०२. देवानां.................. शक्रः।

०३. .... स्वामी सार्थवाहकः।

०४. गवाम् स्वामी ....

०५ ....ईश्वरः कुवेरः।

रामेस्य व्रजनं बलेर्नियमनं पाण्डोः सुतानां वनं
वृष्णीनां निधनं नलस्य नृपतेर्राज्यात् परिभ्रंशनम्।
सौदासं तदवस्थमर्ज्रनवधं संचिन्त्य लङ्केश्वरं
दृष्ट्वा राज्यकृते विडम्बन गतं तस्मान्न त द्वांजयेत्

රාමගේ රටින් පිටුවහල් කිරීම ද, බලිහුගේ බන්ධනය ද, පාණ්ඩුපුත්‍රයන්ගේ වන වාසය ද, යාදවයන්ගේ මරණය ද, නලරජුගෙන් රාජ්‍යගිලිහීම, ලංකේශ්වර රාවණගේ මරණයට සිරගෙයි ලැගීම ද, (බලන කල්හි) සියල්ලෝ කාලයාගේ ඇවෑමෙන් මියයති. කවරෙක් නම් ආරක්ෂා වන්නේ ද ?

07. සප්තමී විභක්තිය (අධිකරණ කාරකය)

ක්‍රියාවට ආධාර වනුයේ අධිකරණය යි. එහි සප්තමී විභක්තිය වේ. මෙය ඖපශ්ලේෂික, සාමීපික, අභිව්‍යාපක, වෛෂයික, නෛමිත්තික, ඖපචාරික වශයෙන් සය වැදෑරුම් වේ.

शयति शयने राधा। - ඖපශ්ලේෂික
तिष्ठति व्यालः वाल्मीके। - සාමීපික,
निम्बेषु विद्यते तिक्तम्। - අභිව්‍යාපක,
हृदि वसति बुद्धः। - වෛෂයික,
अधीते छात्रः विभागे। - ඖපචාරික,
अङ्गुल्यग्रे वसन्ति करिणः। - ඖපශ්ලේෂික

- ක්‍රියාව යමක් මත රඳා පවතී ද එම පදය (ආධාරර්ථයෙහි) සප්තමී විභක්තියේ යෙදේ.

विहगाः नीडे वसन्ति।

ක්‍රියාකාරකම 3.12

०१. वानराः वृक्षेषु निवसन्ति।
०२. अम्बरे विहगाः चलन्ति।
०३. मधु तिष्ठति जिह्वाग्रे।
०४. हृदि हलाहलं विषम् भवति।
०५. राजा सिंहासने तिष्ठति।

01. ඉහත වාක්‍යයන් සිංහලට පරිවර්තනය කරන්න.
02. එම වාක්‍යවල ඇති සප්තමී විභක්තිපද වෙන වෙන ම ලියා අර්ථ දක්වන්න.
03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන තෝරා ලියන්න.

०१. .... बुद्धः तिष्ठति।
०२. .... भिक्षवः वसन्ति।
०३. .... कृषीवलाः बीजानि वपन्ति।

०४. .... उपासकाः वसन्ति ।

०५ .... पञ्च अङ्गुल्यानि भवन्ति ।

(विहाराङ्गने / क्षेत्रे / विहारे / परिवेणे / हस्ते)

- සමූහයකින් එකක් තෝරාගැනීමේ දී සමූහාර්ථ පදය (නිර්ධාරණාර්ථයෙහි) සප්තමී විභක්තිය භාවිත වේ.

पादपेषु वटः वनस्पतिः ।

ක්‍රියාකාරකම 3.13

०१. आर्य्यश्रावकेषु मौद्गल्यायनस्थविरः ऋद्धिप्रातिहार्य्ये अग्रः भवति ।

०२. सर्वभाषासु संस्कृतभाषा अतिश्रेष्ठ भाषा भवति ।

०३. काव्येषु नाटकं रम्यं भवति ।

०४. नाटकेषु सकुन्तला मनोज्ञं भवति ।

०५. अध्यापनेषु परिवेणाध्यापनं विषिष्ठाध्यापनं भवति ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත සඳහන් වාක්‍යවල සප්තමී විභක්ති පද ලියා ඒවායෙහි අර්ථ ලියන්න.

03. පහත සඳහන් වචනවලින් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය තෝරා ලියන්න.

१. सर्व .... विद्या उत्तमं द्रव्यं भवति ।	१. आचार्येषु
२. .... सोमानन्दभिक्षुः संस्कृतभाषाकथने पाठवः ।	२. मृगेषु
३. सर्व .... गजः कायेन अति स्थूलः जन्तुः ।	३. छात्रेषु
४. .... कालिदास महाकविः अद्वितीयः ।	४. द्रव्येषु
५ .... गुत्तिलः सुप्रकटः आचार्यः ।	५ कवीषु

• අකමැත්තක්, අප්‍රසාදයක් හැඟවෙද්දී ඊට ලක් වන්නා (අනාදරාර්ථයෙහි) සප්තමී විභක්තිය වේ.

प्रहरति चोरः धनिके विलपति ।

ක්‍රියාකාරකම 3.14

०१. देवेषु रुदत्सु कौलिकः वृक्षमछिन्दत् ।

०२. मातरि रुदति दारकः विदेशं गतः ।

०३. पृथग्जनभिक्षुषु रुदत्सु बुद्धः परिनिर्वाणम् अगमत् ।

०४. मयि अनिच्छन्ते आचार्यः विहारात् अगमत् ।

०५. प्रेमवती वारिते प्रेमवन्तः विषम् अपिबत् ।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යවල ඇති සප්තමී විභක්ති පද ලියා දක්වා ඒවායේ තේරුම් ලියන්න.

03. පහත සඳහන් පද යොදාගනිමින් නිවැරදි වාක්‍ය සකසන්න.

०१. कृतोऽपि / पुत्रः / अकुर्वत् / सुरापानं / पितरि / दोषारोपणं

०२. अधावत् / निवारयति / अजातशत्रुकुमारः / पित्रं / मातरि

०३. बुद्धं / अन्वगच्छत् / नन्दः / अनिच्छति / सुन्दरी

०४. सहस्रबुद्धिः / एकबुद्धेः / उपदिशति / न प्रतिगृह्णाति

०५. अवर्षत् / कृषीवलेषु / देवः / अनिच्छन्तेषु

• කාලාර්ථයක් හැඟවෙන කල්හි ප්‍රසිද්ධ ක්‍රියාවත්, ඉන් කියවෙන නාමයත් (භාවාර්ථයෙහි) සප්තමී විභක්තිය ගනී.

उदयति सूर्ये लिखामि गीतम् ।

ක්‍රියාකාරකම 3.15

०१. अथ तस्यां गतायांब्राह्मणोऽपि गृहात् निर्गतः।

०२. तेषु गतेषु मण्डूकः आह।

०३. वेश्मनि सर्वतः दह्यमाने सः शयीत।

०४. अजितात्मन् मयि प्रव्रजिते ते संविद् न अस्ति।

०५. मृत्यौ पशहस्ते तिष्ठति प्रमाद्यात् शोच्यः।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙහි ඇති සප්තමී විභක්ති පද ලියා තේරුම් ලියන්න.

03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පද තෝරා ලියන්න.

०१. गुरौ .... शिष्यः बहिर्गतः।

०२. मातरि .... पुत्रः गृहात् निर्गतः।

०३. बुद्धे परिनिर्वाणं .... पृथिवि कम्पनं अभवत्।

०४. अस्मासु .... वानरः आगतः।

०५. नन्दः .... सुन्दरी अरुदत्।

(उपदिशति / सुप्ते / मृते / हसति / गच्छति)

- කර්මය සමග යෙදී ඇති නිමිත්ත පැවසෙන නාමය ද (නිමිත්තාර්ථයෙහි) සප්තමී විභක්තිය ගනී.

छिनत्ति वृक्षं दारुषु।

ක්‍රියාකාරකම 3.16

०१. सूदाः काष्ठेषु वृक्षं छिन्दति।

०२. चोराः दन्तयोः हस्तिं हन्ति।

०३. व्याधः विशानेषु मृगान् नश्यति।

०४. अङ्गुलिमालः अङ्गुल्येषु नरान् मारितवान्।

०५. कर्मखराः रत्नेषु भूमिं खनन्ति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙම වාක්‍යවල ඇති සප්තමී විභක්ති පද ලියා ඒ වචනවල අර්ථය දක්වන්න.

03. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට වඩාත් නිවැරදි වචනය තෝරා ලියන්න.

०१. श्रामणेरः.................. श्वेतवस्त्रं रञ्जयति।

०२. सर्वे सत्वाः.................. आहारं अनुभवन्ति।

०३. किरातः.................. व्याघ्रं हन्ति।

०४. कृषीवलाः..................बीजानि वपन्ति ।

०५. नराः.................. वनानि विनश्यति।

(चर्मणि / जीवितेषु / काष्टेषु / चीवरेषु / धान्येषु)

- ස්වාමී, ඊශ්වර, අධිපති ආදී ශබ්දයන් හා යෙදෙන නාමය සප්තමී විභක්ති ගනී.

कवीषु श्रेष्ठः अश्वघोषः।

ක්‍රියාකාරකම 3.17

०१. उपमासु कालिदासः प्रमुखः भवति।

०२. अर्थगौरवे भारवी प्रधानः भवति।

०३. उपदेशे विष्णुशर्मः निपुणः भवति।

०४. तर्कणे नीतिज्ञः चतुरः भवति।

०५. धर्मे स्वामी तथागतः भवति।

०६. धनेषु ईश्वरः कुवेरः भवति।

०७. शद्वानुप्रासे अश्वघोषयतीन्द्रः कुशलः भवति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න. සප්තමී විභක්ති පද තෝරන්න.

02. පහත වාක්‍යවලට සුදුසු සප්තමී විභක්ති පද යොදන්න.

०१. ....स्वामी गोपालः भवति ।

०२. .... अधिपतिः राजा भवति ।

०३. .... निपुणः रावणः भवति ।

०४. .... स्वामी पिङ्गलकः भवति ।

०५ .... ईश्वरः चन्द्रः भवति ।

(वने / रोत्रौ / युद्धे / गोषु / नरेषु)

පහත ඇති වාක්‍යවල හිස්තැන් පුරවන්න.

01. අවධාරණාර්ථයෙහි .... විභක්ති පද යෙදේ.
02. නිර්ධාරණාර්ථයෙහි .... විභක්ති පද යෙදේ.
03. අනාදරාර්ථයෙහි .... විභක්ති පද යෙදේ.
04. භාවාර්ථයෙහි .... විභක්ති පද යෙදේ.
05. නිමිත්තාර්ථයෙහි .... විභක්ති පද යෙදේ.
06. ස්වාමී, ඊශ්වර, අධිපති, ආදී ශබ්ද සමග .... විභක්ති පද යෙදේ.

उत्स्वे व्यसने प्राप्ते
दुर्भिक्षे शतृशंकटे ।
राजद्वारे श्मशाने च
यस्तिष्ठतिस बान्धवः ॥

උත්සවයෙහි ද, විපතක් ආ විට ද, ආහාරපාන හිඟගල්හි ද, සතුරු උපද්‍රව ඇතිවිට ද, රජදොරටුවෙහි ද, සොහොනෙහි ද යමෙක් අත්නොහැර සිටියි නම් ඔහු නෑයෙකි.

कथा १

कस्मिंश्चिदधिष्टाने देवशर्मा नाम ब्राह्मणः प्रतिवसति स्म। तस्य भार्या सुतमजनयत्। तस्मिन्नेव दिने नकुली नकुलम् प्रसूय मृता। अथ सा सुतवत्सला दारकवत् तमपि नकुलं स्तन्य-दानाभ्यङ्गमर्दनादिभिः पुपोष। परं तस्य न विश्वसिति। अपत्यस्नेहस्य सर्वस्नेहातिरिक्तया सततमेवमाशङ्गते। यत् कदाचिदेष स्वजातिदोषवसादस्य दारकस्य विरुद्धमाचरिष्यति इति।

अथ सा कदाचिच्छय्यायां पुत्रं शाययित्वा जलकुम्भमादाय पतिमुवाच। ब्राह्मणजलार्थमहं तडागे यास्यामि। त्वया पुत्रोऽयं नकुलाद्रक्षणीयः। अथ तस्यां गतायां ब्राह्मणोऽपि शून्यं गृहं मुक्त्वा भिक्षार्थं क्वचिन्निर्गयः। अत्रान्तरे दैववशात् कृष्णासर्पो बिलान्निष्क्रान्तः। नकुलोऽपि तण् स्वभ-ाववैरिणं मत्वा भ्रातृरक्षणार्थं सर्पेण सह युद्ध्वा सर्पं खण्ड्शः कृतवान्। ततो रुधिरप्लावित-वदनः सानन्दं स्वव्यापारप्रकाशणार्थं मातुः सम्मुखे गतः। माताऽपि तं रुधिरक्लिन्नमुखमवकोक्य शङ्कितचित्ता नूनमनेन दुरात्मना मम दारको भक्षित इति विचिन्त्य कोपात् तस्योपरि तं जलकुम्भं चिक्षेप। एवं सा नकुलं व्यापद्य यावत् प्रलपन्ती गृह आगच्छति तावत् सुतस्तथैव सुप्तस्तिष्टति। समीपे कृष्ण सर्पं खण्डशः कृतमवलोक्य पुत्रवधशोकेनात्मशिरोवक्षःस्थलं च ताडयि-तुमारब्धा। अत्रान्तरे ब्राह्मणो गृहीतनिर्वापः समायातो यावत् पश्यति तावत् पुत्रशोकाभि-तप्ता ब्राह्मणीप्रलपति। भो भो लोभात्मन् लोभाभिभूतेन त्वया न कृतं मद्वचः। तदनुभव साम्प्रतं पुत्रमृत्युदुःखवृक्षफलम्। अथवा साध्विदमुच्यते

ක්‍රියාකාරකම 3.18

01. ඉහත ඡේදයේ හමුවන පහත දී ඇති පහත වචනවල විභක්ති නම් කරන්න.

ब्राह्मणः	....
शोकेन	....
जलकुम्भं	....
शय्यायां	....
मातुः	....
त्वया	....
सर्पं	....
सा	....
तडागे	....
बिलात्	....

02. පහත සඳහන් වචන හා ඉදිරියෙන් ඇති විභක්ති ගලපන්න. ඊතල මගින් යා කරන්න.

වචන	විභක්ති
तस्यां गतायां	प्रथमा
अस्य दारकस्य	पञ्चमी
नकुलात्	द्वितीया
अनेन दुरात्मना	सप्तमी
मुरवं	षष्ठि
सुतः	पञ्चमी
बिलात्	तृतीया
त्वया	द्वितीया
फलम्	तृतीया
ब्राह्मणी	प्रथमा

03. පහත සඳහන් වැකිවල ඇති කාරක ප්‍රයෝග කවරේදැයි සඳහන් කරන්න.

०१. कोपात् तस्योपरि तं जलकुम्भं चिक्षेप।

०२. तस्यां गतायां ब्राह्मणोपि शून्यं गृहंमुक्त्वा भिक्षार्थं क्वचित् निर्गतः।

०३. यत् कदाचित् एष स्वजातिदोषवसात् अस्य दारकस्य विरुद्धं आचरिष्यति।

०४. त्वया पुत्रोऽयं नकुलादुक्षणीयः।

०५. अत्रान्तरे दैववशात् कृष्णसर्पो बिलान्निष्क्रान्तः।

०६. सर्पेन सह युद्ध्वा सर्पः रवण्डशः कृतवान् ।

०७. मातापि शङ्कितचित्ता नूनमनेन दुरात्मना मम दारको भक्षित इति।

०८. समीपे कृष्णसर्पं खण्डशः कृतमवलोक्य पुत्रवधशोकेन आत्मशिरो वक्षस्थलं च ताडयितुमारब्ध।

०९. भोः ! भेः ! लोभात्मन् त्वया नकृतं मद्वचः।

१०. सा सुतवत्सला दारकवत् तमपि नकुलं पुपोष।

04. පහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

०१. नन्दः मुनौ धर्मं ब्रुवाणोऽपि मदनैककार्य्यं विजहार।

०२. नन्दः ज्ञातिषु धर्मं प्रति आदृतेषु प्रियया सहायः विजहार।

०३. सा सुन्दरी स्त्रिषु सुन्दरी बभूव।

०४. नंन्दः नरेषु अत्यन्तमनोहरेण रूपानुरूप चेष्टितौ बभूव।

०५. तथागतः च आगतभैक्षकालः भैक्षाय तस्य वेश्म प्रविवेश।

०६. बुद्धः प्रेक्षजनस्य प्रमादात् भिक्षां अलब्ध्वा पुनः जगाम।

०७. अस्य जनस्य अनुग्रहाय भगवान् गुरुः नः गृहं प्रविष्टः शङ्के।

०८. नन्दः च अग्रतः गत्वा तस्मै अग्रतमाय ननाम।

०९. प्रासादसंस्थः अनुग्रहाय भगवन्तं अन्तः प्रविष्टं अश्रौषं।

१०. परांमुखः नन्द तु सुगतं अन्यमनस्कं विज्ञाय मार्गात् आरात् गृहं यियासुः ससार।

११. नन्द तु दुःखेन विचेष्टमानः भार्य्यामुखं व्यचिन्तयन् शनैः आगत्य गुरुं अन्वगच्छत्।

१२. स्नेहेन समः कश्चित् पाशः न अस्ति।

१३. तृष्णा समं हारि श्रोतः न अस्ति।

१४. राग अग्निना समः अग्निः न अस्ति।

१५. हस्तगतै औषधैः कश्चन सविद्यः पन्नगेन नदंश्यते।

१६. जितलोभमोहः अनपेक्षः शोकभुजङ्गमेन न दश्यते।

१७. महर्षिः आनन्दः नन्दं शमाय प्रव्रजय इति अब्रवीत्।

१८. यः वेश्मनि दह्यमाने मोहात् शयीत।

१९. सः व्याधिजरा शिखेन काल अग्निना लोके प्रदीप्ते प्रमत्तः भवेत्।

२०. वैद्यः अनिष्टं औषधं निगृह्य आतुराय ददाति एतत् प्रतिकूलं तुभ्यम् अनुग्रहाय उक्तम्।

२१. तपः क्षयात् विमानात् च्युतं प्रियं ईक्षमाना अप्सरसांवरेव इव ।

२२. करुणात्मकस्य साधोः मत् नित्यभीरोः अतिदाक्षिण्य आर्यस्य अभूतपूर्वम् अयं विकारः कुतः ।

२३. यदि मुनौ तस्य प्रसादः स्यात् उग्रात् अनृतात् मृत्योः इव बिभीयात् ।

२४. सः चेत् तम् अन्यस्य जनस्य बिभर्ति चलसौहृदाय तस्मै नमः अस्तु ।

२५ सबाष्पा स्त्री सम्भ्रान्तं तं विमानं आरुह्य तां इति गिरं उवाच ।

२६. त्वत् परितोषहेतोः जिजीविषुः सः तु नेत्रजलार्दुवक्त्रः भ्राता आर्य्यो तथागतेन प्रव्राजितः।

२७. किन्नार्यः अद्रिपृष्टम् इव त्रासेन अन्तर्गृहात् विमानम् आरुरुहुः।

२८. साध्वीव्रतं कामवत् आश्रितानां यासां गृहाणि तपो वनानि इव।

२९. अत्र मनस्विनी रूपवती गुणाढ्या का हृदि क्षते

३०. हर्षकाले विक्लवा किं रोदषि।

३१. कृच्छासु आपत्सु आगतासु त्वां पश्यतां तस्य दुःखं न भवेत्।

३२. यः भावः यः च रागः तत् त्वत् विरहात् धर्मे न रंश्यते।

05. ඉහත වාක්‍යවල ඇති වචනවලින් ඒ ඒ විභක්තිවලට අයත් වචන වෙන වෙන ම පහත වගුවේ පිළිවෙළට ගොනු කරන්න.

ප්‍රථමා	ද්විතීයා	තෘතීයා / කරණ	චතුර්ථී	පඤ්චමී	ෂෂ්ඨී	සප්තමී

06. පහත සඳහන් කාරක ප්‍රයෝගවලට මෙම වාක්‍යයන්ගෙන් නිදසුන් 1 බැගින් තෝරා ලියන්න.

I. භාව සප්තමී
II. අකථිත කර්ම ද්විතීයා
III. අපාදානාර්ථයේ පඤ්චමී
IV. නිර්ධාරණාර්ථයේ සප්තමී
V. තාදර්ථයේ චතුර්ථී
VI. නමෝ යෝගේ චතුර්ථී
VII. ආරාත් අව්‍යයෝගේ පඤ්චමී
VIII. සහ නිපාතයෝගේ තෘතීයා
IX. කරණාර්ථයෙහි තෘතීයා
X. අනීප්සිත කර්මයෝගයේ ද්විතීයා

07. ඉහත වාක්‍යවල ඉරිඇඳි වචනවල විභක්ති / කාරක ප්‍රයෝග නම් කරන්න.

नासमीक्ष्य परं स्थानं पूर्वमायतनं त्यजेत्।
වෙනත් තැනක් නොසොයා මුල් තැන අත් නොහළ යුතු ය.

नास्ति व्यसनिनानांकिञ्चिद्धुवि पर्याप्तये धनम्।
ධනය ම සොයන අයට සෑහීම සඳහා පොළවේ ධනයක් නැත.

निसर्गः स हि धीराणां यदापद्यधिकं दृढम्।
විපතේදී වඩා ශක්තිමත් වීම ධෛර්යවන්තයන්ගේ සහජ ගුණයකි.